## ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
# ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

DNCWS

# කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීම

මෙම දෙපාර්තමේන්තුව තුළ දැනට පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරි තනතුරු 04 ක් සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

| පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| නුවරඑළිය | 02 |
| මහනුවර | 01 |
| පුත්තලම | 01 |

**අධ්‍යාපන සුදුසුකම් -**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිත විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයන් තුනකින් එකවර සමත් වීම.

**වෘත්තීය සුදුසුකම් -**

i. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ
ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) හෝ
iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ
v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම (සිවිල්) හෝ
vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්) හෝ
vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් (සිවිල් අංශයෙන්) ලබා තිබීම.

**ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් -**

i. නව ජල සම්පාදන ව්‍යාපෘතියන්හි ඇස්තමේන්තු හා සැලසුම් සැකසීම/පරීක්ෂා කිරීම.
ii. දැනට පවත්නා ව්‍යාපෘති පුනරුත්ථාපනය/ වැඩි දියුණු කිරීම.
iii. වැසි ජලය එක්රැස් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
iv. ඉදිකිරීමේ අධීක්ෂණය හා බිල්පත් පරීක්ෂාව.

**සාමාන්‍ය කොන්දේසි -**

i. මෙම තනතුරට වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.
(ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හිමිකමක් නැත)
ii. තෝරා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්ක වල සේවය කිරීමට එකඟ විය යුතුය.
iii. මෙම පත් කිරීම අවලංගු කිරීම/ සංශෝධනය කිරීම සඳහා බලතල දෙපාර්තමේන්තු ප්‍රධානියා සතුය.
iv. අයදුම්කරුවන් වසය අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.
v. ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
vi. පරිගණක භාවිතයේ හැකියාව තිබිය යුතුය.
vii. ක්ෂේත්‍රයේ රාජකාරි ඉටු කිරීමට මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
viii. අයදුම්පත් කැඳවන අවසන් දිනට ඉහත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

වැටුප -

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 03 වැටුප් ක්‍රමයෙහි III ශ්‍රේණියේ ආරම්භක වැටුප වන රු. 31,040.00 ක් හා ජීවන වියදම් දීමනාව ඇතුළුව කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

ඉහත සුදුසුකම්ලත් අයදුම්කරුවන් නම, ලිපිනය, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්, දුරකතන අංකය, විද්‍යුත් තැපෑල ආදී තොරතුරු ඇතුළත් කර තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් 2024.04.19 දින **හෝ ඊට පෙර** ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ යුතුය. (ලියුම් කවරයේ වම්පස කෙළවරේ **"කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීම"** ලෙස සඳහන් කළ යුතුය)

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**
**තැ.පෙ. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ.**
**දුරකථන - 011 2775861**
**2024.04.05**

@SELACINE